# ලිංගික බලය, ප්‍රතිකාර විධියක් කර ගත් මනෝවිද්‍යාඥයා - විල්හෙල්ම්රී

**සු ප්‍රසිද්ධ මනෝවිද්‍යාඥයෙකු වන සිග්මන් ප්‍රෝයිඩ්, කාමාශාව හඳුන්වාදී තිබෙන්නේ, මිනිසා මෙහෙයවන මූලික බලවේගයක් ලෙසිනි. කාමාශාවෙන් තොර පුද්ගලයෙකුට සාර්ථක මිනිසෙකු විය නොහැකියැයි හෙතෙම තරයේ විශ්වාස කළේ ය.**

සිරිල් අභයගුණවර්ධන

ඔහු මෙන් ම තවත් ජර්මන් ජාතිකයෙකු වූ මනෝවිද්‍යාඥ විල්හෙල්ම්රී, සිග්මන් ප්‍රොයිඩ් ගේ ගෝලයෙකු නොවූව ද මේ මතය තවත් ඉදිරියට ගෙන ගොස්, ලිංගික උත්තේජනය ප්‍රතිකාර විධියක් කර ගත් වෛද්‍යවරයකු ලෙස හැඳින්විය හැක. හෙතෙම මිනිසා තුළ පවතින කාමාශාව නිසා හටගන්නා අභ්‍යන්තර ජීව ශක්තින් පිළිබඳව මහත් විශ්වාසයක් ඇතිකර ගත්තේ ය.

මේ විශ්වාසය විසින් ඔහු මහත් අවාසනාවන්ත ඉරණමකට ඇද දැමුව ද, ඔහු සිය ජීවිතය අවසාන වන තුරුම එම ඇදහීමත් සමග දැවැන්ත අරගලයක් කරගෙන ගියේ ය.

හෙතෙම සිය රෝගීන් සුවපත් කිරීම සඳහා මේ ක්‍රමය සාර්ථක ලෙස උපයෝගී කර ගත්තේ ය. එහෙත් ඒ නිසාම, වැඩිකල් යෑමට පෙර ඔහු සමාජ විරෝධියෙකු ලෙස හංවඩු ගසනු ලැබී ය. අනතුරුව සිරගත කෙරුණු හෙතෙම, පිස්සෙකු ලෙස සලකා නොකතා හරිනු ලැබිණ.

මේ නිසා විල්හෙල්ම්රී තුළ සැබැවින් ම ක්‍රියාත්මක වූයේ කුමක් ද? ඔහුට වැරදුනේ කොහේදී ද? ඇත්තටම ඔහුගෙන් මග හැරුණේ කවරක් ද? යන කාරණා ගැන සොයා බැලීම අපට ද ප්‍රයෝජනවත් වේ.

මනෝවිද්‍යාව පිළිබඳව ලෝකයේ ඉතා ම වැදගත් නමක් හැටියට විල්හෙල්ම්රී පිළිගැනී ඇත.


සමහර විට ඔහු දෙවැනි වන්නේ ප්‍රකට මනෝවිද්‍යාඥ සිග්මන් ප්‍රොයිඩ් ට පමණි. අප්‍රකට අහම්බයක් වූ එක්තරා දෛවෝපගත සිදුවීමක් නොවන්නට ප්‍රොයිඩ්ගේ ලාබාලම ශිෂ්‍යයා වන්නට තිබුණේ ද විල්හෙල්ම්රී ය. එහෙත් අවාසනාවකට එය එසේ සිදුවූයේ නැත.

එම සිදුවීමෙන්, චීන දර්ශනිකයකුව සිටි 'සෙන්' ගේ ගති ලක්ෂණයක් ප්‍රොයිඩ් තුළ ද පැවති බව අනාවරණය විය.

වෙනත් බොහෝ ප්‍රාඥයින් අතර ද කලාතුරකින් මේ ගතිය සාමාන්‍යයෙන් දක්නට ලැබෙන නමුදු , සිග්මන් ප්‍රොයිඩ් තුළ එවැන්නක් පැවතීම අසාමාන්‍ය කාරණයක් වූයේ ය. එලෙසම , එමගින් හෙළිදරව් වූයේ, ඇතැම් අවස්ථාවක අද්භූත ලෙස හැසිරීමේ ප්‍රවණතාවක්, ප්‍රොයිඩ් තුළ ද පැවති බවයි. එහෙත් මේ හිතළුව ඔහුට අදාළ නොවන්නේ නම් එය වෙනම කාරණයකි.

විල්හෙල්ම්රී, ප්‍රොයිඩ්ගේ ගෝලයෙකු වීම සඳහා ඉල්ලුම් කළ ද එය ප්‍රතික්ෂේප විය. එහෙත් රී නොනවත්වාම ප්‍රොයිඩ්ට ලිව්වේ ය. තවමත් ඔහු තරුණයෙකි.

ඒ වන විට ඔහුගේ වයස අවුරුදු 35 කි. එය ප්‍රොයිඩ්ගේ වයසින් හරි අඩකි.



**විල්හෙල්ම්රී, ප්‍රොයිඩ්ගේ ගෝලයෙකු වීම සඳහා ඉල්ලුම් කළ ද එය ප්‍රතික්ෂේප විය. එහෙත් රී නොනවත්වාම ප්‍රොයිඩ්ට ලිව්වේ ය. තවමත් ඔහු තරුණයෙකි. ඒ වන විට ඔහුගේ වයස අවුරුදු 35 කි. එය ප්‍රොයිඩ්ගේ වයසින් හරි අඩකි.**

කෙසේ වුවද සිග්මන් ප්‍රොයිඩ් තරුණයින් ප්‍රිය නොකළේ ය. ඔහුගේ පර්යේෂණ කටයුතු කල් අල්ලන සුලු විය.

ඔහු සමග වැඩ කළ අනෙක් සියලුම සහායකයෝ පැරණි වැඩිහිටි අය වූහ. ඒ සමගම ඔහුගේ ව්‍යාපාරය ජාත්‍යන්තර මට්ටමට පැමිණ තිබිණ. එබැවින් දැන් ඔහුට තරුණයින් බඳවා ගැනීම දුෂ්කර වී ඇත. ඔහු රී ප්‍රතික්ෂේප කළේ මේ නිසා ය. එහෙත් මෙසේ ඔහු විසින් නොසලකා හැරුණේ, තමන්ගේ හොඳම ශිෂ්‍යා බව ඔහු නොදන්නේ ය.

එසේ වුවද විල්හෙල්ම්රී, දැඩි හිතක් ඇති ජර්මානුවෙකි. එහෙයින් ඔහුව ප්‍රතික්ෂේප කිරීමෙන් සියල්ල නතරවේයැයි ඔබට හිත හදාගත

**ප්‍රොයිඩ් විසින් ම ඔහු ප්‍රතික්ෂේප කරනු ලැබීම රීගේ යහපතට හේතු විය. මේ අනුව හෙතෙම අලුත් ක්ෂේත්‍රයකට තෙමේම දොරහැර ගත්තේ ය. ඊට ප්‍රොයිඩ් ගේ අනුබලය ලැබීමේ හේතුවෙන් සිය ජීවිත කාලය පුරාම ඔහු ප්‍රොයිඩ්ට කෘතඥ වූයේ ය. ඒ පිළිබඳව හෙතෙම මෙසේ කියා තිබේ.''ඔබ මාව ප්‍රතික්ෂේප නොකළානම් නිකම් ම ප්‍රොයිඩ් වාදියෙක් වෙනවා. ඒ වෙලාවෙදි නම් මට ලොකු වේදනාවක් ඇතිවුණා. නමුත් දැන් මම එසේ තනි කිරීම ගැන ඔහුට බෙහෙවින් ස්තූති වන්ත වෙනවා. මට පටන් ගන්න සිද්ධවුණේ පහුරු ගෑමෙන්.**

නොහැක. හෙතෙම ප්‍රොයිඩ් හමුවීමට අවස්ථාවක් ඉල්ලා සිටියේ ය. එම ඉල්ලීම ද පිළි නොගැනිණි. එහෙත් ඒ ගැන නොසලකා හෙතෙම ප්‍රොයිඩ් හමුවීමට ගියේ ය. ඔහු දෙරට තට්ටු කළේ ය. ප්‍රොයිඩ් විසින් ම දෙර හරින ලදි. දෙදෙනාම එකවර එකිනෙකා දෙස බැලූහ. දෙදෙනා තුළ ම මොහොතක නිහැඩියාවක් පැවතිණි.

"මම හමුවීම අවලංගු කළාගත්.....?" ප්‍රොයිඩ් ප්‍රශ්න කළේ ය.

" නමුත් මම එහෙම කළේ නැතෙ.....!" රී පිළිතුරු බැන්දේ ය.

"හමුවීමක් සිද්ධවෙන්නෙ දෙන්නෙක් අතරෙ. ඒක නිසා එක්කෙනෙකුට විතරක් ඒක අවලංගු කරන්න බෑ. එහෙම වෙන්න නං දෙන්නම එකඟ වෙන්න ඕන. ඔබ මෙක අවලංගු කරාට මට ඒක අවශ්‍ය යි. ඒ නිසයි මම එන්න තීරණය කළේ... යි තම පිළිතුර පැහැදිලි කළේය.

සිග්මන් ප්‍රොයිඩ් අප්‍රසන්න මුහුණින් රී දෙස බලාගෙන සිටියේ ය. "මෙ මිනිහත් එක්ක මං මොනව කරන්න ද?" ඔහු තමාගෙන් ම ප්‍රශ්න කළේ ය. අනතුරුව හේ රීට කෙළින් ම කතා කළේ ය. "මම දැන් වයස යි. ඔබ තවමත් තරුණ යි. මගේ දර්ශනය සම්පූර්ණයෙන් ම ඔබට කියා දෙන්න මට වෙලාවක් නැතිවේවි. ඒ විතරක් නෙවෙයි, මගේ අදහස් වලට ඔබ එකඟ නොවන්නත් පුළුවන් ඒකට හේතුව, මෙතැන පරම්පරා පරතරයක් තියෙන එකයි. ඉතින් , ඇයි ඔබ කාලය නාස්තිකර ගන්නෙ ? ඔබ, ඔබේම දෙයක් පටන් ගන්න. මෙන්න මගේ සුබ පැතුම්."

ඇසේ පිරී කඳුලෙන් යුතුව විල්හෙල්ම්රී සිග්මන් ප්‍රොයිඩ්ට ආචාර කර ඕය නිවස බලා ගියේ ය. අනතුරුව හෙතෙම මිනිස් මනසේ ක්‍රියාකාරිත්වය හා සිතිවිලි වල ස්වභාවය පිළිබඳව ද මිනිසා තුළ පවතින චිත්ත ශක්තිය ගැනද හදාරන්නට පටන් ගත්තේ ය.

මෙහිදී ප්‍රොයිඩ් විසින් ම ඔහු ප්‍රතික්ෂේප කරනු ලැබීම රීගේ යහපතට හේතු විය. මේ අනුව හෙතෙම අලුත් ක්ෂේත්‍රයකට තෙමේම දොරහැර ගත්තේ ය. ඊට ප්‍රොයිඩ් ගේ අනුබලය ලැබීමේ හේතුවෙන් සිය ජීවිත කාලය පුරාම ඔහු ප්‍රොයිඩ්ට කෘතඥ වූයේ ය. ඒ පිළිබඳව හෙතෙම මෙසේ කියා තිබේ."ඔබ මාව ප්‍රතික්ෂේප නොකළානම් නිකම් ම ප්‍රොයිඩ් වාදියෙක් වෙනවා. ඒ වෙලාවෙදි නම් මට ලොකු වේදනාවක් ඇතිවුණා. නමුත් දැන් මම එසේ තනි කිරීම ගැන ඔහුට බෙහෙවින් ස්තූති වන්ත වෙනවා. මට පටන් ගන්න සිද්ධවුණේ පහුරු ගැමෙන්. ඒත් එහෙම කරල ,සම්පූර්ණයෙන් ම වෙනත් දිසාවකට මට යන්න පුළුවන් වුණා. මට දැන් සිග්මන් ප්‍රොයිඩ් පේන්නෙ හුදෙක් සිහින විමර්ශකයෙකු වශයෙන් මිස යථාර්ථවාදී මනෝ විග්‍රහයක් කළ කෙනෙකු හැටියට නොවෙයි...."

සිහින යනු සිතේ පහළවන සෙවනැලි විශේෂයක් පමණි. දවල් හීන දැක්ම අනහැරීමට හා සාමාන්‍ය සිහිනවල යථා ස්වභාවය දැනගැනීමට බොහෝ මනෝ විග්‍රහ ප්‍රයෝජනවත් වේ. එහෙත් එම විශ්ලේෂණ වල අතිශයෝක්තියක් ද දක්නට ලැබේ..."

මේ නිසාම විලියම්රී මනුෂ්‍ය ශක්තිය සමග වැඩ කිරීම ආරම්භ කළේ ය. ඒ අනුව ඔබ, මනුෂ්‍ය ශක්තිය සොයා යැමේදී අනිවාර්යයෙන් ම ලිංගික බලය කෙරෙහි නැඹුරු වීම අතිශයින්ම ස්වාභාවික වේ. පැරණි භාරතීයයන් ලිංගික සම්භෝගය සැලකුවේ දේව කාර්යයක් ලෙසිනි. මහ පොළොව සරු කිරීම අරභයා ඔවුන් විසින් එළි මහතේ සිට එම දේව කාර්යය නිම කිරීමට පුරුදුව සිටියහ. "ජගන්මාතා" පිදීමේ සිරිත මේ විශ්වාසය මත ගොඩ නැගුණක් බව ඉතිහාසඥයෝ පෙන්වා දෙති. එහෙත් රී විසින් මෙම ලිංගික බලය සොයාගෙන එය ස්පර්ශ කළ කෙණෙහිම, සියලු ආගමික සංවිධාන ඔහුට එරෙහිව නැගී සිටියේ ය. බොහෝ මනෝවිද්‍යාඥයෝ ඔහුගේ පසම්තුරන් වූහ. මේ නිසා ආණ්ඩුව ද ඊට හරස් කපන්නට විය. මෙ අනුව ඔහු වටා ගොඩනැගුණේ විපර්යාසාත්මක පරිසරයකි.

කෙසේ වුවද මෙ මග යමින් සිටිය දී ඔහු ලැබූ අත්දැකීම් අපූරු වුව ද බෙහෙවින් ප්‍රතිඵල දායක විය. එකිනෙකාට හොඳින් ආදරය කරන යුවළක් එකට එකතුවීමේදී ඔවුන්ගේ දෙසිරුර තුළ වූ කිසියම් කාන්දම් බලයක් ජනිත වන බව ඔහු පසක් කර ගත්තේ ය. එහෙත් එවැනි ආදරණීය හැඟීමක් සිතේ නැතුව, කයින් පමණක් එකට සිටින යුවළකගේ සිරුරු තුළින් මේ බලය උත්පාදනය නොවේ. ඔහුට නිර්මාණාත්මක මනසක් මෙන් ම, තාක්ෂණික දැනුමක් ද වූයේ ය. එහෙයින් ජෝඩුවකට එකට එකතු වී අවංකව ආදරය කළ හැකි සුවපහසු පෙට්ටියක් ඔහු විසින් නිර්මාණය කරන ලදී. ඔහුගේ අභිමතය වූයේ මෙමගින් ආදරයේ ශක්තිය තාක්ෂණිකව රඳවා ගෙන පසුව එය වෙනත් කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට ගැනීම යි.

මෙය එතරම් පහසු කටයුත්තක් නොවී ය. අර පෙට්ටිය සම්පූර්ණයෙන් ම හිස් ය. එ තුළ කිසිවක් ද්‍රව්‍යමය වශයෙන් දකින්නට නැත. ඔහු කියන ජීව විද්‍යාත්මක ශක්තිය ද්‍රව්‍යමය ස්වභාවයකින් දැක්විය හැකි මගක් නොවිය. එහෙත් හෙතෙම අතට අසුවූ හැම දෙයක් ම සාධක වශයෙන් එක්රැස් කළේ ය. උදහරණයක් වශයෙන් බෙලහීනතාවයෙන් පෙළුණු කිසිවකු ඔහු සොයා පැමිණියහොත්, ඒ පුද්ගලයා අර පෙට්ටියට දැමීම රීගෙල් ප්‍රතිකාර ක්‍රමය වූයේ ය. දින කීපයකට පසුව හෝ මෙ තැනැත්තා සුවපත් වූයේ ක්‍රියාවිරහිත වූ බැටරියක්, ප්‍රතිශක්තිකරණය කළාක් මෙනි.

එහෙත් මෙය අනියම් සාධකයකි. මේ පෙට්ටිය හැම විට ම හිස් වූයේ නැත. ඔහුගේ පෙට්ටිය තුළට මානව ආදරයේ ශක්තිය බිහි කිරීම සඳහා එහි ඇතුළු කරනු ලැබූ ජෝඩුවලට ඔහු මෙසේ උපදෙස් දී තිබේ. ඒ අනුව, මෙම පෙට්ටියට තුළට ඇතුල්වන යුවළක් අවශ්‍යයෙන් ම ලිංගිකව හැසිරිය යුතු නැත. ඒ වෙනුවට එකිනෙකාට තුරුළු වී, ඒකාත්මිකව වැතිර සිටීම පමණක් ප්‍රමාණවත් වේ.

රීගේ මෙම ශිල්පක්‍රමය සමාජයට පිළිගත නොහැකි අභව්‍ය පිළිවෙතක් විය. එහෙයින් සමාජය විසින් එය පිළිකුලෙන් යුතුව බැහැර කරන ලදී. මේ අනුව, මිනිසුන්ගේ ඇදහීම වූයේ, විල්හෙල්ම්රී සාතන් සමග එකතු වී ඔවුන්ට එරෙහිව කුමන්ත්‍රණයක් ආරම්භ කර ඇති බවයි. එසේම එය මිනිසාට ලිංගික ක්‍රියාවලිය එපා කිරීමට බල කෙරෙන අමානුෂික ව්‍යායාමක් බවයි.

මේ ව්‍යායාමය තුළින් ප්‍රදර්ශනය වූයේ ඔහුගේ විශිෂ්ට ප්‍රඥාව යි. එය පෙරදිග තන්ත්‍රයානයට අතිශයින් ම අදාළ වූවකි. එහෙත් හෙතෙම තන්ත්‍රයානය ගැන කිසිවක් දැන සිටියේ නැත. තන්ත්‍රයානය පෙරදිග සංකල්පයකි. එසේ වුවද රී කවදාවත් පෙරදිග සංචාරය කර නොමැත. රී ට හා ජර්මනියට එකල තන්ත්‍රයානය අලුත් එකක් වුවද පෙරදිගට එය අවුරුදු දස දහසක් තරම් පැරැණි වේ. වැදගත් දේ වන්නේ රී විසින් එය නැවත සොයාගෙන තිබීම යි. එසේම එමගින් හෙතෙම, මෙ වන විට රෝගීන් දහස් ගණනක් සුවපත් කර තිබීම යි.

ලිංගික ශක්තිය ඇත්තට ම පිරිසුදු අභ්‍යන්තර බලවේගයකි. ඒ ශක්තිය විවිධ ස්වභාවයන්ට පරිවර්තනය කළ හැකිවීම එහි විශේෂත්වයක් වේ. එය එක් විටෙක, ඔබේ බුද්ධි ප්‍රභාවය විය හැකි ය. තවත් විටෙක එය ඔබේ නිහඬ පෞරුෂත්වය විය හැකි ය. මේ නිසා ලිංගික බෙලහීනත්වයෙන් පෙළෙන්නකු තුළ ආකර්ශනීය පෞරුෂත්වයක් හෝ නිර්මාණශීලීත්වයක් හෝ දක්නට නොලැබේ. හෙතෙම කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද පරාජිතයෙකි. මේ අනුව මෙම සොයාගැනීම මත පිහිටා විල් හෙල්මරී විවිධ රෝගීන්ට ප්‍රතිකාර කළේ ය.

ඔහුගේ ප්‍රතිකාරය ඉතාම සරල එකකි. මෙහිදී කෙරෙන්නේ රෝගියා කවරෙකු වුවද ඔහු හෝ ඇය, පෙර සඳහන් සුවිශේෂ පෙට්ටිය තුළ වැතිර සිටීමට කටයුතු කිරීම යි. ඒ විනාඩි 15 ට හෝ 20 ට නොවැඩි කාලයක් සඳහා පමණි. එවැනි වාර කීපයකින් පසුව රෝගියා නිරෝගී වේ. එහෙත් මෙය වෛද්‍ය විද්‍යාවට හසු නොවන්නකි. එය වෛද්‍ය විද්‍යාවට පටහැණි වන්නේ මේ සඳහා ඖෂධ කිසිවක් භාවිත නොකිරීම නිසා ය.

නීතියේ අන්ධභාවය මතු වී පෙනෙන්නේ මෙවැනි තැන්වලදී ය. පිළිගත් වෛද්‍ය විද්‍යාත්මක න්‍යායන්ට හා සම්මත ඖෂධීය ප්‍රතිකාරවලට සුවකළ නොහැකි අමුතු ආකාරයේ රෝගීන් දහස් ගණනක් මේ පුද්ගලයා විසින් උක්ත ප්‍රතිකාර විධි උපයෝගී කරගෙන සුවකර තිබේ. එහෙත් මේ ක්‍රමය පිළිගත් වෛද්‍ය විද්‍යාත්මක ප්‍රතිකාර විධියක් හැටියට නොපිළිගැනුණි. ප්‍රශ්නය වූයේ, ඔහු ඒ සඳහා ලියාපදිංචි වී නොසිටීම යි. ඊට හේතුව වූයේ මේ නොපිළිගැනීම හමුවේ ඔහුට ලියාපදිංචිවීමේ අවස්ථාවක් නොලැබීම යි. එබැවින් වෛද්‍යවරයෙකු වශයෙන් මේ ක්‍රමය භාවිත කිරීම සඳහා ඔහුට නිල අවසර පත්‍රයක් නොවී ය.

මේ සම්බන්ධයෙන් විල්හෙල්ම්රී මෙසේ කියා ඇත. "මම ඖෂධ භාවිත කරන්නේ නැත. මම ඖෂධ නියම කරන්නේ ද නැත. මගේ සම්පූර්ණ ඖෂධ පෙට්ටිය පමණ යි.

**ලිංගික ශක්තිය ඇත්තට ම පිරිසුදු අභ්‍යන්තර බලවේගයකි. ඒ ශක්තිය විවිධ ස්වභාවයන්ට පරිවර්තනය කළ හැකිවීම එහි විශේෂත්වයක් වේ. එය එක් විටෙක, ඔබේ බුද්ධි ප්‍රභාවය විය හැකි ය. තවත් විටෙක එය ඔබේ නිහඬ පෞරුෂත්වය විය හැකි ය.**

ඔබ එය ඖෂධයක් ලෙස පිළිගතහොත් අපේ විශ්වවිද්‍යාලවලට සිදුවේවි මේ පෙට්ටිය ඇතුලෙ තියෙන්නේ මොනවිදියේ ඖෂධයක් ද කියල සොයල බලන්න. මම සොයාගෙන තිබෙන දේ ගැන ඔබට කිව්වොත් ඔබ හිතාවි මම උන්මත්තකයෙක් කියල. මම රෝගී මිනිස්සු සුව කළාම ඔබ කියාවි මම අපරාදකාරයෙක් කියල. ඒත් මම කිසිම කෙනෙකුට හානියක් කරල නෑ...."

කෙසේ වුවද වෛද්‍ය මණ්ඩලය, ක්‍රිස්තියානි පල්ලිය සහ ආණ්ඩුව ඔහුට විරුද්ධව එක පිට එක නඩු කියන්නට විය. එහෙත් මේ නඩුවලට ඔහු වරදකරුවෙකු කළ නොහැකි විය. ඔහුට එරෙහිව අපරාධකාරී සිදුවීම් කිසිවක් අනාවරණය කර ගැනීමට පැමිණිලි කරුවන් අසමත් වීම ඊට හේතු වේ. එමගින් කළ හැකි වූ එකම දෙය, ඔවුන් විසින් දීර්ඝකාලයක් තිස්සේ රී ට අනොරක් නැති කරදර ඇති කිරීම පමණි. නඩුහබ වැඩිවත් ම රී ගේ ආවේගය ද වැඩිවන්නට විය. ඔහු සතසා ඔහුට සහයෝගය දැක්වීමට කිසිවෙකුත් නොවීය. අඩුම වශයෙන් ඔහු අයත් වූ වෛද්‍ය ක්ෂේත්‍රය තුළ පවා හිතවත් කෙනෙකු සිටියේ නැත. ඔවුන් ඔහුට අකමැති වූයේ මනුෂ්‍ය ප්‍රජාව ගැන හෝ වෛද්‍ය විද්‍යාව ගැන හෝ ඔවුන් තුළ පැවැති විශේෂ ලෙන්ගතුකමක් නිසා නොවේ.ඔවුන්ගේ මනෝවිශ්ලේෂණ ක්‍රමය හා ප්‍රතිකාර විධියට රී ගේ ක්‍රමයෙන් ප්‍රබල අභියෝගයක් එල්ල වී තිබුණු හෙයිනි.

අවසර පත්‍රයක් නොමැති කිසිවකු, වෛද්‍යවරයකු ලෙස නොපිළිගැනීමට වෛද්‍ය මණ්ඩලය අකමැති විය.

මිතුරන්, ඔහු අත්හැර ගිය ද තමන් විසින් සොයාගන්නා ලද දේ පිළිබඳව ඔහු තුළ ලොකු අභිමානයක් පැවැතියේ ය. එය මනුෂ්‍ය සමාජයට බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකි සොයාගැනීමක් බව ඔහු තරයේ විශ්වාස කළේ ය. එහෙත් එය අනිත් අයට පහදදීමේ හැකියාවක් තමාට නැති බව ද හෙතෙම පිළිගත්තේ ය. ඒ නිසාම සමාජය තමන් පිස්සකු ලෙස සැලකීම පිළිබඳව ඔහුට කළ හැකි දෙයක් නොවී ය. මිනිස්සු ඔහුගේ මූණට ම සිනාසුණෝ ය. පුවත්පත්වල ඔහු ගැන විකට චිත්‍ර පළවන්නට විය. ඒ අතරම, ඔහුට විරුද්ධව තව තවත් නඩු වැටෙන්නට විය.

අන්තිමේදී සිදු වූයේ , අවසර පත්‍රයක් නොමැතිව වෛද්‍ය ප්‍රතිකාර කරන්නේ යැයි සලකා ඔහු දඬුවම් යැවීම යි. සමාජය කොතරම් අගතිගාමී වන්නේදැයි මෙයින් ඔබට අවබෝධ වනු ඇත. ඔබට එය සුවකිරීමක් ලෙස හැඳින්විය හැකි නමුත්, ඒ සඳහා බෙහෙත් කිරීමක් හෝ බෙහෙත් නියම කිරීමක් හෝ කරන

**මේ අර්ථයෙන් සලකන විට විල්හෙල්ම්රී මෙතෙක් ලොව සියළුම විප්ලවවාදීන් අතුරෙන් මහම විප්ලවවාදියා විය. එහෙත් හෙතෙම තවමත් අප්‍රසිද්ධ පුද්ගලයෙකි. ගරුකටයුතු කෙනෙකු නොවීය. එහෙයින් ම බොහෝ දෙනා විසින් අමතක කර දමා ඇත්තෙකි.**

බවට ප්‍රකාශයක් කළ නොහැක. ඕනෑම පරීක්ෂණ කණ්ඩායමක් සමග සහයෝගයෙන් වැඩකිරීමට ඔහු සූදානම්ව සිටියේ ය. එපමණක් නොව තමන්ගේ සොයාගැනීම පිළිබඳව හෙතෙම, හැමවිටම විවෘතව කතා කළේ ය. බලධාරීන්ට ඔහු වරදකරුවකු කර ගත හැකිවූයේ අවසර පත්‍රයක් නැතුව වෙදකම් කිරීම නිසා පමණි.

අවාසනාවට ඔහුගේ අනාවරණයක් කතෝලික ඉගැන්වීම්වලට පටහැනි විය. ඒවා සම්මත සදචාර සම්ප්‍රදායයන්ට එරෙහි විය. මෙලෙස ඔවුන් විසින් පෙන්වා දෙනු ලැබූ ආකාරයට, විල්හෙල්මරී අධ්‍යාපනය, සංස්කෘතිය හා දේශපාලනය ආදී හැම සමාජ ක්ෂේත්‍රයකටම විවෘත අභියෝගයක් විය. මේ අනුව, ඔහුගේ විශ්වාසය හා ක්‍රමවේදය යන දෙකම සම්මත සමාජ ව්‍යූහයට විරුද්ධ ව්‍යාපාරයක් වූයේ ය.

මේ අර්ථයෙන් සලකන විට විල්හෙල්මරී මෙතෙක් ලොව සියළුම විප්ලවවාදීන් අතුරෙන් මහම විප්ලවවාදියා විය. එහෙත් හෙතෙම තවමත් අප්‍රසිද්ධ පුද්ගලයෙකි. ගරුකටයුතු කෙනෙකු නොවීය. එහෙයින් ම බොහෝ දෙනා විසින් අමතක කර දමා ඇත්තෙකි. ඔහු වටා පැවැති පරිසරය මෙසේ වූ හෙයින් හිරගෙදර දී ඔවුන් ඔහුට බරපතළ ලෙස වධහිංසා පමුණුවා ඇත.

කෙසේ වුවද රී පහසුවෙන් බිඳ දැමිය හැකි මිනිසකු නොවීය. ඔහු පිළිබඳව හොඳින් දන්නා අයගේ පිළිගැනීම අනුව රී කළේ හොඳින් මුල්බැස ගත්, ශක්තිමත් පදනමක් සහිත, සම්පූර්ණ අවබෝධයකින් කටයුතු කරන දැවැන්ත දුෂ්කර කාර්යයක් විය. එහෙත් හිරගෙදරදී මේ දැවැන්තයා නිකම්ම උන්මත්තකයෙකු විය. එය බලහත්කාරයෙන් ඔහු මත ආරෝපණය කරන්නට ඇතැයි සිතිය හැකි ය. මිනිසෙකු මුළුමනින් ම අසරණ වූ විට හා බලය හැම අතින් ම ඔබ අත පවතින විට, ඔහු උමතුභාවයට පත්කිරීම පහසු කාර්යයකි. ;කසේ හෝ මෙයින් පසු ඔහු ඇත්තට ම පිස්සකු විය.

මේ ලෝකයේ හැටි යි. ඔහු ප්‍රසිද්ධිය හිණිපෙත්තේ සිටින විට ඔහුට ඕනෑතරම් මිතුරු මිතුරියෝ වූහ. සහකරුවෝ සිටියහ. ඔහුට ඇලළුම්

කළ සුරූපී ගැහැනියක් ද බිරිඳ ව සිටියා ය. එහෙත් හෙතෙම පිස්සකු ලෙස ගිරෙන් එළියට ආ විට ඒ කිසිවකු දක්නට නොවී ය. ඔහුගේ සහකරුවෝ තමන්ගේ ආරක්ෂාව හා සුබසිද්ධිය තකා රී සමග කටයුතු කළ නොහැකි බව මූණට ම කියා සබඳකම් අත්හැර දැමූහ. ඔහුත් සමග ගිතවත්කම් පැවැත්වීමෙන් තමාත් ද සැකයට භාජනය වන බව ඔවුන් විසින් පෙන්වා දෙන ලදී. ඒ එක්ගම ඔහුට කලක් ආදරය කළ බිරිඳ වූ අර ගැහැනිය ද ඔහු ගෙන් දික්කසාද වූවා ය.

අවසානයේදී ඔහු මිය ගියේ ය. මෙහිදී හෙතෙම මැරුණා නොව, මිය යෑමට බල කළා යැයි කීම සාවද්‍ය නොවේ. ඔබ මේ ආකාරයෙන් කිසිවෙකු නොසලකා හැරියොත් හෙතෙම මහ සාගරය මැද හුදෙකලා වූ දූපතක් මෙන් තනිවනු ඇත. සමාජශීලීව ජීවත් වූ කෙනෙකුට මේ තනිවීම දරාගත නොහැකි දුකකි. වේදනාවකි. එය මරණය ඉක්මන් කෙරෙන ව්‍යාධියක් බවට ඉක්මනින් ම පත්වනු ඇත. ඔහු තනිකමට බිය විය. ඒ බියෙන්ම හැකිළී හෙතෙම මිය ගියේ ය.

ඔහුගේ මරණය මෙන්ම විමතියට පත් විය යුතු තවත් කාරණයක් වන්නේ, ඔහු විසින් පටන් ගැනුණු ව්‍යාපෘතිය, ඔහුගේ ඇවෑමෙන් තිබුණු තැනම ලොප්වීම යි. බැලූ බැල්මට ම එය අද්භූතකයක් ප්‍රලාපයක් ලෙස පෙනුණ ද එහි සාධනීය ලක්ෂණ රැසක් ම තිබිණ. කිසිවකු විසින් හෝ එම සාධනීය ප්‍රවණතා වැඩි දියුණු කළ යුතුව තිබිණ, එසේ ම එය සංවර්ධනය කළ යුතු වන්නේ, කලින් ද සඳහන් කර ඇති පෙරදිග තන්ත්‍රයානය අනුව යි. මක්නිසාදයත් රී ගේ සුවපත් කිරීමේ ක්‍රමවේදය, තන්ත්‍රයානයේ වෛදික රහස් මත පදනම් වී තිබෙන හෙයිනි.

විල්හෙල්ම් රී වූකලී නූතන තන්ත්‍රයානයේ පුරෝගාමීයෙකැයි මෙම ලිපියේ පෙර සඳගත් කර ඇත. එහෙත් හෙතෙම පෙරදිගට පැමිණ නැති බවත්, පෙරදිග තන්ත්‍රයානය පිළිබඳව කිසිවක් නොදැන සිටි බවත් ප්‍රකට ය. මේ නිසා සිතිය හැක්කේ රී තුළ මීට පෙර ආත්මවලදී ලබාගත් තන්ත්‍රයානය පිළිබඳ දැනුමක් තිබෙන්නට ඇති බවයි. ඒ අනුව විල්හෙල්ම්රී ඉහත ආත්මයක පෙරදිග උගතෙකු වී සිටින්නට ඇතැයි සතීම අතිශයෝක්තියක් විය නොහැක.

දැනට වසර දෙදහසකට පමණ පෙර ඉන්දියාවේ දෙලක්ෂයක පමණ තන්ත්‍රයාන අනුගාමිකයින් සහිත විශේෂ තන්ත්‍රවාදී ජනකායක් සිටි බව සමහරවිට ඔබ විශ්වාස කරන එකක් නැත. එකල ඔවුන් සිටියේ නිරුවත්ව යි. එක් යුවලක් එක ලිහිල් ඇඳුමක් ඇඳීම ඔවුන්ගේ සිරිත විය. එම ඇඳුම වියා තිබුණේ විශේෂිත සේද වර්ගයකිනි. එමගින් ඔවුන්ගේ දෙසිරුරෙහි විකිරණය පිටතට යැම හා පිටත අවශේෂ විකිරණ ඔවුන්ගේ සිරුරට වැදීම වැළැක් වේ. ගෙයින් පිටත යන, සිහමතේ යැම වැනි කවර කටයුත්තකදී වුව ද ඔවුන් සිටියේ මෙම ඇඳුම පිටිනි.

**විල්හෙල්ම් රී වූකලී නූතන තන්ත්‍රයානයේ පුරෝගාමීයෙකැයි මෙම ලිපියේ පෙර සඳහන් කර ඇත. එහෙත් හෙතෙම පෙරදිගට පැමිණ නැති බවත්, පෙරදිග තන්ත්‍රයානය පිළිබඳව කිසිවක් නොදැන සිටි බවත් ප්‍රකට ය. මේ නිසා සිතිය හැක්කේ රී තුළ මීට පෙර ආත්මවලදී ලබාගත් තන්ත්‍රයානය පිළිබඳ දැනුමක් තිබෙන්නට ඇති බවයි. ඒ අනුව විල්හෙල්ම්රී ඉහත ආත්මයක පෙරදිග උගතෙකු වී සිටින්නට ඇතැයි සතීම අතිශයෝක්තියක් විය නොහැක.**

**මේ බලයේ උපරිමයේ දී ඔබ බුද්ධිමතෙකු වෙයි. වෙනකිසිවෙකුට විනාශ කළ නොහැකි පර්වතයක් ලෙසින් ඔබ ශක්තිමත් වෙයි. ඉතින් මේ බලය රෝග සුවකිරීමේ ප්‍රතිකාර විධියක් ලෙස යොදා ගත හැකි නම් එසේ කිරීම, අපරාධයක් වන්නේ ඇයි? එය විද්‍යාවට හසු නොවන නිසා ද? විල්හෙල්ම්රී, තමන් සොයා ගත් මෙම අලුත් ක්‍රමවේදයට විද්‍යාත්මක වදනක් සංස්ථාපනය කිරීමට උනන්දු වූයේ නම්, එය වැළැක්වීමට කතෝලික පල්ලියට, ආණ්ඩුවට හෝ වෙනත් කිසිවෙකුට හෝ අවසරයක් ලැබෙන්නේ නැත.**

මෙසේ සිටීමෙන් ඔවුන් ලොකු පර්යේෂණයක් කළ බව සඳගත් වේ. එමගින් විරුද්ධ ලිංගික දෙපොළක් ඒකාත්මික වී ඔවුන්ගේ කයින් පිටවන ජීවවිද්‍යාත්මක විදුලිබලය එකිනෙකට මිශ්‍ර වන බවත්, එය ගැඹුරු භාවනාවට බෙහෙවින් උපකාරී වන බවත් ඔවුහු විශ්වාස කළහ. එම විද්‍යුත් ශක්තිය නිසා සිතට නැඟෙන වෙනත් හානිකර සිතුවිලි මැඩපැවැත්වේයැයි ද ඔවුහු සිතූහ.

භාරතයේ රාජා බෝජ් රජුගේ කාලයේ දී මෙවැනි ජෝඩු ලක්ෂයක් සිට ඇත. එහෙත් ඔවුන්ගේ ස්වභාවය හා ගතිගුණ පිළිබඳව රජු බෙහෙවින් උදහස් වී තිබේ. "මොවුන් අපේ සංස්කෘතිය ම විනාශ කරනවා. එයින් අපේ ළමා පරපුරම දූෂණය වෙනවා. මේ ළමයි මොවුන් දැක, ඔවුන් මොන විදිහේ මිනිස් කොටසක්දැයි විමසති. මොවුන් නිති ඇඳුමක් ඇතුළේ නිරුවත්ව සිටින නිසා මේ මිනිස්සු අපේ ආගමත් සමාජ සම්ප්‍රදායයත් මුළුමනින් ම විනාශ කරති."

රාජාබෝජ් රජු මේ සියලූ දෙනාම මරා දැමීමට තීරණය කළේ ය. ඒ අනුව තන්ත්‍රයාන ජනකායේ දෙලක්ෂයට පණපිටින් ගිනිතබා මරාදමනු ලැබිය. ඔවුන් අතුරෙන් එකම යුවලක්වත් ඉතිරි නොවීමට බෝජ්රජු පෞද්ගලිකවම වගබලා ගත්තේ ය. ඔවුන්ගේ සියලූ ලේඛන සහ සාහිත්‍යය ද නවාතැන් හා අසප්‍ර ද ගෙවල් දොරවල් ද ගින්නෙන් විනාශ කෙරුණේ ය. මෙබඳු අමානුෂික මුළිනුපුටා දැමීමක් මානව ශිෂ්ටාචාරය තුළ මින් පෙර හෝ පසුව හෝ සිදුවී නොමැත. ඇතැම් විට විල්හෙල්ම්රී එසමයේ මෙම තන්ත්‍රයානික ජනකායේ ප්‍රමුඛයෙකුව සිටින්නට ඇත.

ඔබ ලිංගිකතාවයේ බලය පිළිබඳව වඩා හොඳින් දැන ගන්නා විට කිසිම බලවතෙක් අනෙක් මිනිසුන් එම බලය අත්විඳිනවාට කැමැති නොවන බව ද කෝපවන්නට ද ඉඩ තිබේ. රාජාබෝජ් රජුගේ ජන සංහාරය පිටුපසින් ඇත්තේද මෙම බලය තණ්හාව සම්බන්ධ මානසිකත්වය බව ඔබට දැන් හොඳින් පැහැදිලි වී ඇති බැවිනි.

මේ බලයේ උපරිමයේ දී ඔබ බුද්ධිමතෙකු වෙයි. වෙනකිසිවෙකුට විනාශ කළ නොහැකි පර්වතයක් ලෙසින් ඔබ ශක්තිමත් වෙයි ඉතින් මේ බලය රෝග සුවකිරීමේ ප්‍රතිකාර විධියක් ලෙස යොදා ගත හැකි නම් එසේ කිරීම, අපරාධයක් වන්නේ ඇයි? එය විද්‍යාවට හසු නොවන නිසා ද?

විල්හෙල්ම්රී, තමන් සොයා ගත් මෙම අලුත් ක්‍රමවේදයට විද්‍යාත්මක වදනක් සංස්ථාපනය කිරීමට උනන්දු වූයේ නම්, එය වැළැක්වීමට කතෝලික පල්ලියට, ආණ්ඩුවට හෝ වෙනත් කිසිවෙකුට හෝ අවසරයක් ලැබෙන්නේ නැත.